Lesson 69 **එකම යහළුකම , වෙනස් නිල ඇඳුම්**

Same friendship, different uniforms

"Supun, can’t you stay a little longer ? Mother is going to make some tea” Sandun said.

“සුපුන් , කාන්ට් යු ස්ටේ අ ලිට්ල් ලෝංග(ර්) ? මදැ(ර්) ඉස් ගොයිං ටු මේක් සම් ටී” සඳුන් සෙඩ්

“සුපුන්, ඔයාට තව ටිකක් වෙලා ඉන්න බැරිද ? අම්ම තේ වගයක් හදන්න යන්නේ “සඳුන් කිව්වා

“The sky is getting dark. It’s going to rain,” Supun replied.

“ද ස්කයි ඉස් ගෙටිං ඩාක්. ඉට්ස් ගොයිං ටු රේන් “ සුපුන් රිප්ලයිඩ්

“අහස කළුවර වේගෙන යනවා. වහින්න යන්නේ “ සුපුන් පිළිතුරු දුන්නා

“It won’t rain soon. She is making some sweetmeats for us too. Let’s have some tea before you go.”

“ඉට් වෝන්ට් රේන් සූන් . ෂී ඉස් මේකිං සම් ස්වීට්මීට්ස් ෆෝ අස් ටූ . ලෙට්ස් හැව් සම් ටී බිෆෝ යූ ගෝ “

ඉක්මනින් වහින එකක් නෑ . එයා (ඇය) අපිට කැවිලි වගයකුත් හදනවා . ඔයා යන්න කලින් තේ ටිකක් බොමු

“Hmm… that’s a good idea. But I think I should go home before it rains. Otherwise, I will get wet, and my mother will be angry with me. She will scold me.”

“හ්ම්ම් .. දැට්ස් අ ගුඩ් අයිඩියා. බට් අයි තිංක් අයි ෂුඩ් ගෝ හෝම් බිෆෝ ඉට් රේන්ස්. අද(ර්)වයිස් අයි විල් ගෙට් වෙට් ඇන්ඩ් මයි මදැ(ර්) විල් බී ඇංග්‍රි විත් මී. ෂී විල් ස්කෝල්ඩ් මී

“හ්ම්ම්.. ඒක නම් හොඳ අදහස . නමුත් මං හිතන්නේ මං ගෙදර යන්න ඕන වහින්න කලින්. නැත්නම් මං තෙමෙයි, අම්මට කේන්ති යාවි මාත් එක්ක. එයා මට බනීවි “

“I’ll go to the kitchen and check if she has finished.”

“අයිල් ගෝ ටු ද කිචන් ඇන්ඩ් චෙක් ඉෆ් ෂී  හැස් ෆිනිශ්ඩ් “

“මං කුස්සියට ගිහිල්ල බලන්නම් එයා ඉවරද කියලා “

Supun had come to visit Sandun during the school holidays. They used to attend the same school, but now Sandun was studying at a different school after passing the scholarship exam. It was a well-known school in the city.

සුපුන් හැස්  කම් ටු විසිට් සඳුන් ඩියුරින්  ද ස්කූල්  හොලිඩේස් . දේ යූස්ඩ් ටු අටෙන්ඩ් ද සේම්  ස්කූල් , බට්  නව්  සඳුන් වෝස්  ස්ටඩීං   ඇට්  අ ඩිෆරන්ට් ස්කූල්  ආෆ්ට(ර්) පාසිං ද ස්කොල(ර්)ෂිප් එග්සෑම් . ඉට් වෝස්  අ වෙල් නෝන් ස්කූල්  ඉන් ද සිටි.

පාසල් නිවාඩු කාලය තුල සඳුන් බැලීමට සුපුන් පැමිණ තිබුණි . ඔවුන් කලින් ගියේ එකම පාසලකටය.නමුත් දැන් ශිෂ්‍යත්ව විභාගය සමත් වීමෙන් පසුව , සඳුන් ඉගෙන ගනිමින් සිටියේ වෙනත් පාසලකය. එය නගරයේ ප්‍රසිද්ධ පාසලකි

Supun had also passed the exam, but he was not interested in going to a big school in the city. He liked spending time with his family,his parents and siblings. He loved his village school

සුපුන් හැඩ්   ඕල්සෝ  පාස්ඩ් දී එග්සෑම් , බට් හී  වෝස් නොට්  ඉන්ටරෙස්ටඩ් ඉන් ගොයිං  ටු අ බිග් ස්කූල්  ඉන් ද සිටි . හී  ලයික්ඩ් ස්පෙන්ඩිං ටයිම් විත් හිස් ෆැමිලි , හිස් පේරන්ට්ස්  ඇන්ඩ්  සිබ්ලිංස් . හී ලව්ඩ් හිස් විලේජ් ස්කූල්

සුපුන්ද  විභාගය සමත්ව තිබුණි . නමුත් ඔහුට  නගරයේ විශාල පාසලකට යාමේ උනන්දුවක් නොතිබුණි . ඔහු කැමති  වූයේ  තම පවුලේ අය , දෙමව්පියන් සහ සහෝදර සහෝදරියන් සමග කාලය ගත කිරීමටය . ඔහු තම ගමේ පාසලට බෙහෙවින්  ප්‍රිය කළේය

After Sandun moved to a school in the city, they rarely met each other. That’s why Supun wanted to visit his friend during the holidays. They had so much to talk about. Supun was curious about Sandun’s new school.

ආෆ්ට(ර්) සඳුන් මූව්ඩ් ටු අ ස්කූල් ඉන් ද සිටි , දේ රෙයාලි මෙට් ඊච්  අද(ර්) . දැට්ස් වයි සුපුන් වෝන්ටඩ්  ටු විසිට් හිස් ෆ්‍රෙන්ඩ් ඩියුරින්  ද හොලිඩේස් . දේ හැඩ් සෝ මච් ටු ටෝක් අබවුට් . සුපුන් වෝස්  කියුරියස් අබවුට් සඳුන්’ස් නිව් ස්කූල්

සඳුන් නගරයේ නේවාසික පාසලට මාරු වූ  පසු ඔවුන් හමුවූයේ  ඉතා කලාතුරකිනි . සුපුන්ට පාසල් නිවාඩු කාලය තුල තම මිතුරා හමුවීමට අවශ්‍ය වූයේ  අන්න ඒ නිසයි . ඔවුන්ට කතා කිරීමට බොහෝ දේ තිබුණි .සඳුන්ගේ අලුත් පාසල පිලිබඳ දැන  ගැනීමට සුපුන්ට කුතුහලයක් තිබුනි

“How is your new school, Sandun?”
“හව් ඉස් යුව(ර්) නිව් ස්කූල්, සඳුන් ?“
ඔයාගේ අලුත් ඉස්කෝලේ කොහොමද සඳුන් ?

“Hmm… not bad. It’s a big school.”
“හ්ම් .. නොට් බැඩ් . ඉට්ස් අ බිග් ස්කූල් “
“හ්ම් .. වරදක් නෑ , ඒක ලොකු ඉස්කෝලයක්”

“How about your new friends?”
“හව් අබවුට් යුව(ර්) නිව් ෆ්‍රෙන්ඩ්ස් ?”
“ඔයාගේ අලුත් යාලුවෝ කොහොමද ?”

“They are okay, but everyone is very focused on their studies.”
“දේ ආ ඕකේ , බට් එව්රිවන් ඉස් සෝ ෆෝකස්ඩ් ඔන් දෙයා ස්ටඩීස් ”
“ඒගොල්ල වරදක් නෑ, නමුත් ඒගොල්ලෝ හැමෝම ගොඩක් ඉගෙනීමට යොමු වෙලා ඉන්නේ” (Focus - යොමු වෙනවා / අවධානය යොමු කරනවා ) (studies - ඉගෙනීම් කටයුතු )

“How are the teachers?”
“හව් ආ ද ටීච(ර්)ස් ? “
“ටීච(ර්)ස්ල කොහොමද ?”

“They are strict. Stricter than our village school teachers. You must do your homework and get good marks in tests. They also have very strict rules about discipline.”
“දේ ආ ස්ට්‍රික්ට් , ස්ට්‍රික්ට(ර්) දෑන් අව(ර්) විලේජ් ස්කූල් ටීච(ර්)ස් . යූ මස්ට් ඩූ යුව(ර්) හෝම් ව(ර්)ක් ඇන්ඩ් ගෙට් ගුඩ් මාක්ස් ඉන් ටෙස්ට්ස් . දේ ඕල්සෝ හැව් වෙරි ස්ට්‍රික්ට් රූල්ස් අබවුට් ඩිසිප්ලින් “
“ඒගොල්ලෝ හරිම තදයි , අපේ ගමේ ඉස්කෝලේ ටීච(ර්)ස් ලට වඩා තදයි .ගෙදර වැඩ කරන්න ඕන , විභාග වලින් හොදට ලකුණු ගන්න ඕන . විනය ගැනත් ඒගොල්ලන්ගේ ගොඩක් තද නීති තියෙනවා “

“How many students are there in your class?”
“හව් මෙනි ස්ටුඩන්ට්ස් ආ දෙයා ඉන් යුව(ර්) ක්ලාස් ?”
“ඔයාගේ ක්ලාස් එකේ කීදෙනෙක් ඉන්නවද ?”

“Fifty!”

“ෆිෆ්ටි “
“පනහයි “

“What?” Supun asked in surprise.
“වට්  ? “ සුපුන් ආස්ක්ඩ් ඉන් සප්‍රයිස්
“මොනවා ?”  සපුන් පුදුමයෙන් ඇසුවේය

“Yes, 25 boys and 25 girls.”
“යස්  , 25 බෝයිස් ඇන්ඩ් 25 ග(ර්)ල්ස්  “
“ඔව් , ගෑණු  ළමයි 25යි පිරිමි ළමයි 25යි “

“We had only 27 students in our class, both boys and girls.”
‘වී හෑඩ්  ඔන්ලි 27 ස්ටුඩන්ට්ස් ඉන් අව(ර්) ක්ලාස් , බෝත්  බෝයිස් ඇන්ඩ්  ග(ර්)ල්ස් “
“අපේ ක්ලාස් එකේ හිටියේ ළමයි 27ක් විතරයි  , ගෑණු  ළමයි පිරිමි ළමයි
දෙගොල්ලොම”

“Yes, that’s because it’s a village school. But this is a popular city school with many students. In our grade, there are five  classes. Each class has 50 students, so there are 250 students in one grade.”

“ය(ර්)ස්, දැට්ස් බිකෝස්  ඉට්ස් අ විලේජ් ස්කූල් , බට් දිස් ඉස් අ පොපියුල(ර්) සිටි ස්කූල්  විත් මෙනි ස්ටුඩන්ට්ස් . ඉන් අව(ර්) ග්‍රේඩ් , දෙයා ආ  ෆයිව් ක්ලාසස්. ඊච්  ක්ලාස් හෑස්  ෆිෆ්ටි ස්ටුඩන්ට්ස් , සෝ දෙයා ආ ටූ  හන්ඩ්‍රඩ්  ෆිෆ්ටි ස්ටුඩන්ට්ස්  ඉන් වන් ග්‍රේඩ්”

“ඔව් , ඒ ගමේ ඉස්කොලයක් නිසා . නමුත් මේක ළමයි ගොඩක් ඉන්න ජනප්‍රිය නගරේ ඉස්කෝලයක් . අපේ ශ්‍රේණියේ පන්ති 5ක් තියෙනවා. එක් එක්  පන්තියේ ළමයි 50 ගානේ ඉන්නවා , ඒ විදියට එක ශ්‍රේණියක ළමයි 250 ක් ඉන්නවා “

Supun could not believe it. In their village school, each grade had only two classes. There were about 60 students in total.

සුපුන් කුඩ්  නොට් බිලීව් ඉට් . ඉන් දෙයා විලේජ් ස්කූල්  , ඊච්  ග්‍රේඩ් හෑඩ්  ඔන්ලි ටූ ක්ලාසස්. දෙයා ව(ර්) අබවුට් සික්ස්ටි ස්ටුඩන්ට්ස් ඉන් ටෝටල්

සුපුන්ට එය විශ්වාස කිරීමට නොහැකි විය . ඔවුන්ගේ ගමේ පාසලේ එක් එක් ශ්‍රේණියකට තිබුනේ පන්ති දෙකක් පමණි. සිසුන් සිටියේ මුළු ගණනින් 60ක් පමණ ගණනකි

“Are you friends with all the students in your class?” Supun asked curiously.

“ආ යූ ෆ්‍රෙන්ඩ්ස් විත් ඕල් ද ස්ටුඩන්ට්ස් ඉන් යුව(ර්) ක්ලාස් ? “ සුපුන් ආස්ක්ඩ් කියුරියස්ලි

“ඔයා පන්තියේ ඔක්කොම ළමයි එක්ක යාලුද ? “සුපුන් කුතුහලයෙන් ඇසුවේය

“No, I have two or three good friends. They are also new students. Three or four others are friendly, but I don’t know the rest very well. They are okay, but not very friendly.”

“නෝ , අයි හැව් ටූ ඕ ත්‍රී ගුඩ් ෆ්‍රෙන්ඩ්ස් . දේ ආ ඕල්සෝ නිව් ස්ටුඩන්ට්ස් , ත්‍රී ඕ ෆෝ අද(ර්)ස් ආ ෆ්‍රෙන්ඩ්ලි , බට් අයි ඩෝන්ට් නෝ ද රෙස්ට් වෙරි වෙල් . දේ ආ ඕකේ, බට් නොට් වෙරි ෆ්‍රෙන්ඩ්ලි”

“නැහැ , මට දෙතුන් දෙනෙක් ඉන්නවා හොඳ යාළුවො. ඒගොල්ලොත් අලුත් ළමයි . තව හතර පස් දෙනෙක් හිතවත්. නමුත් අනිත් අය ගැන මම වැඩිය දන්නේ නැහැ , ඒගොල්ලෝ වරදක් නැහැ නමුත් ගොඩක් හිතවත් නැහැ”

“How strange!” Supun said. He couldn’t believe Sandun had only a few friends in a class of fifty students. In their village school, everyone was friendly with each other.

“හව් ස්ට්‍රේන්ජ් ! “සුපුන් සේඩ් . හී කුඩ්න්ට් බිලීව් සදුන් හැඩ් ඔන්ලි අ ෆිව් ෆ්‍රෙන්ඩ්ස් ඉන් අ ක්ලාස් ඔෆ් ෆිෆ්ටි ස්ටුඩන්ට්ස් . ඉන් දෙයා විලේජ් ස්කූල් එව්රි වන් වෝස් ෆ්‍රෙන්ඩ්ලි විත් ඊච් අද(ර්)

“කොච්චර පුදුමද !” සුපුන් කීවේය . සිසුන් පනහක් සිටින පන්තියක සදුන්ට මිතුරන් සිටින්නේ කිහිප දෙනෙකු පමණක් වීම ඔහුට විශ්වාස කල නොහැකි විය .ඔවුන්ගේ ගමේ පාසලේ නම් සෑම කෙනෙකුම සෑම කෙනෙක් සමගම මිත්‍ර ශීලි විය

“I’m happy that I didn’t leave our village school.” Supun said

“අයිම් හැපී දැට් අයි ඩිඩ්න්ට් ලීව් අව(ර්) විලේජ් ස්කූල් “ සුපුන් සේඩ්

“මට සතුටුයි මම අපේ ගමේ ඉස්කෝලේ දාල නොගිය එකට “ සුපුන් කීවේය

“To be honest, I like the village school too. I like the environment, the teachers, and the students. Everything feels familiar. But the city school is better for education. There is a lot of competition. Everyone tries to be the best, so they study hard.”

“ටු බී ඔනස්ට් , අයි ලයික් ද විලේජ් ස්කූල් ටූ . අයි ලයික් දි එන්වයරමන්ට් , ද ටීච(ර්)ස් , ඇන්ඩ් ද ස්ටුඩන්ට්ස් . එව්රිතිං ෆීල්ස් ෆමිලියු(ර්). බට් ද සිටි ස්කූල් ඉස් බෙට(ර්) ෆෝ එඩියුකේෂන් . දෙයා ඉස් අ ලොට් ඔෆ් කොම්පෙටිෂන් . එව්රිවන් ට්‍රයිස් ටු බී ද බෙස්ට් , සෝ දේ ස්ටඩි හාඩ් “

“අවංකවම කිව්වොත් , මාත් කැමතියි ගමේ ඉස්කෝලෙට , මං කැමතියි පරිසරේට , ගුරුවරුන්ට , ළමයින්ට . හැමදේම හුරුපුරුදු විදියට දැනෙන්නේ . නමුත් නගරේ ඉස්කෝලේ අධ්‍යාපනයට වඩා හොදයි . ලොකු තරගයක් තියෙනවා .හැමෝම උත්සාහ කරන්නේ හොදම කෙනා වෙන්න , ඒ නිසා ඒගොල්ලෝ මහන්සියෙන් ඉගෙන ගන්නවා”

While they were talking, Sandun’s mother was making sweetmeats for them. By the time she finished, the sky looked darker, and it seemed like it would rain soon.

“වයිල් දේ ව(ර්) ටෝකිං සඳුන්‘ස් මද(ර්) වෝස් මේකිං ස්වීට් මීට්ස් ෆෝ දෙම් . බයි ද ටයිම් ෂී ෆිනිශ්ඩ්ල ද ස්කයි ලුක්ඩ් ඩාක(ර්) , ඇන්ඩ් ඉට් සීම්ඩ් ලයික් ඉට් වුඩ් රේන් සූන්

ඔවුන් කතා කරමින් සිටින අතරතුර සඳුන්ගේ මව ඔවුන් වෙනුවෙන් රසකැවිලි සාදමින් සිටියාය .ඇය අවසන් වන වෙලාව වන විට අහස තවත් කළු කර තිබුණු අතර ඉක්මනින් වහින ලකුණු පෙනෙන්නට තිබුණි.

“Boys, please have some sweetmeats. I made them especially for you,” she said, giving them a plateful of sweetmeats. “I will make some tea for you.”

“බෝයිස් , ප්ලීස් හැව් සම් ස්වීට් මීට්ස්. අයි මේඩ් දෙම් ස්පෙෂලි ෆෝ යූ . ෂී සේඩ් ගිවිං දෙම් අ ප්ලේට් ෆුල් ඔෆ් ස්වීට්මීට්ස් . අයි විල් මේක් සම් ටී ෆෝ යූ “

“ළමයි , රසකැවිලි ටිකක් කන්න , මම විශේෂයෙන්ම ඒවා ඕගොල්ලන්ට හැදුවේ , ඔවුන්ට රස කැවිලි පිරුණු පිඟානක් දෙමින් ඇය කීවාය . මම ඕගොල්ලන්ට තේ ටිකක් හදන්නම්”

“Thank you , Aunty, but I have to go,” Supun said.
“තැන්ක් යූ ආන්ටි ,බට් අයි හැව් ටු ගෝ “. සුපුන් සේඩ්
“ස්තූතියි ආන්ටි , නමුත් මම යන්න ඕන “, සුපුන් කීවේය

“Oh, so early?”
“ඕහ් , සෝ අ(ර්)ලි ?”
“ආ , මෙච්චර වේලාසනින් ?”

“It’s going to rain.”
“ඉට්ස් ගොයිං ටු රේන්”
වහින්න යන්නේ

“Ah, let me see… Yes, the clouds are gathering. It looks like it will rain soon. You should go home now. Otherwise, you will get wet and fall sick. But you still have time for a cup of tea.” She went into the kitchen again to make some tea.

“අහ් , ලෙට් මී සී … යස් , ද ක්ලවුඩ්ස් ආ ගැදරිං. ඉට් ලුක්ස් ලයික් ඉට් විල් රේන් සූන් . යූ ෂුඩ් ගෝ හෝම් නව් . අද(ර්)වයිස් යූ විල් ගෙට් වෙට් ඇන්ඩ් ෆෝල් සික් . බට් යූ ස්ටිල් හැව් ටයිම් ෆෝ අ කප් ඔෆ්(කපොෆ් ) ටී “. ෂී වෙන්ට් ඉන්ටු ද කිචන් අගේන් ටු මේක් සම් ටී

“ආ .. ඉන්න බලන්න , ඔව් , වලාකුල් එකතු වෙනවා(ආකාසේ අඳුරු වෙනවා ). ඉක්මනින් වහිවී වගේ .ඔයා දැන් ගෙදර යන්න ඕන .එහෙම නැත්නම් ඔයා තෙමිලා ලෙඩ වෙයි , නමුත් ඔයාට තවමත් තේ එකක් බොන්න වෙලාව තියෙනවා “තේ ටිකක් සෑදීමට ඇය කුස්සියට ගියාය .

She came back in a minute with milk tea for the two boys. Now, it was beginning to drizzle.

ෂී කේම් බැක් ඉන් අ(ඉන) මිනිට් විත් මිල්ක් ටී ෆෝ ද බෝයිස් ,
නව් ඉට් වෝස් බිගිනිං ටු ඩ්‍රිස්ල්

ඇය මිනිත්තුවකින් පිරිමි ළමුන් දෙදෙනාට කිරි තේ සමග ආපසු ආවාය . මේ වෙනකොට පොද වැටීමට පටන් ගනිමින් තිබුණි

“I think you should wait until the rain stops. Otherwise, you will get caught in the rain,” Sandun’s mother said.

අයි තිංක් යූ ෂුඩ් වේට් අන්ටිල් ද රේන් ස්ටෝප්ස් . අද(ර්)වයිස් යූ විල් ගෙට් කෝට් ඉන් ද රේන් “. සඳුන්’ස් මද(ර්) සේඩ්

“මම හිතන්නේ ඔයා ඉන්න ඕන වැස්ස පායනකල් . එහෙම නැත්නම් ඔයාව වැස්සට අහුවේවි “. සඳුන්ගේ මව කීවාය

“That’s what I just told him, Amma,” Sandun added.
“දැට්ස් වට් අයි ජස්ට් ටෝල්ඩ් හිම් අම්මා “සඳුන් ඇඩඩ්
“ඒක තමයි මම දැන් එයාට කිව්වේ අම්මේ “සඳුන්ද කිවේය

“No, Aunty. If I stay until the rain stops, it will be dark. I need to get back home before then,” Supun replied.

“නෝ ආන්ටි , ඉෆ් අයි(ඉෆයි ) ස්ටේ අන්ටිල් ද රේන් ස්ටොප්ස් ඉට් විල් බී ඩාක්. අයි නීඩ් ටු ගෙට් බැක් හෝම් බිෆෝ දෙන් “ සුපුන් රිප්ලයිඩ්

“නෑ ආන්ටි ,මම වැස්ස පායනකල් හිටියොත් , කළුවර වේවි , ඊට කලින් මම ගෙදරට යන්න ඕන” සුපුන් පිළිතුරු දුන්නේය

“Do you have an umbrella?” she asked.
“ඩූ යූ හැව් ඇන් අම්බ්‍රෙල්ල ?” ෂී ආස්ක්ඩ්
“ඔයාට කුඩයක් තියෙනවද ? “ඇය ඇසුවාය

“No, but don’t worry. I will hurry up.”
“නෝ , බට් ඩෝන්ට් වොරි , අයි විල් හරි අප් “
‘නෑ , නමුත් කරදර වෙන්න එපා , මම මම ඉක්මන් කරන්නම් (ඉක්මනට යන්නම් ) ”

“I will give you an umbrella. Otherwise, you will get wet in the rain.”
“අයි විල් ගිව් යූ ඇන් අම්බ්‍රෙල්ල . අද(ර්)වයිස් යූ විල් ගෙට් වෙට් ඉන් ද රේන්”
“මම ඔයාට කුඩයක් දෙන්නම් , නැත්නම් ඔයා වැස්සේ තෙමේවි “

“How can I return it, Aunty?”
“හව් කැනයි රිට(ර්)න් ඉට් ආන්ටි ?”
“මම කොහොමද ඒක ආපහු දෙන්නේ ආන්ටි ?”

“Don’t worry about returning it soon. You can bring it back when you visit again. You still have a few more weeks of school vacation,” she said kindly.

“ඩෝන්ට් වොරි අබවුට් රිට(ර්)නිං ඉට් සූන් . යූ කැන් බ්‍රිං ඉට් බැක් වෙන් යූ විසිට් අගේන් . යූ ස්ටිල් හැව් අ ෆිව් මෝ වීක්ස් ඔෆ් ස්කූල් වැකේෂන් “. ෂී සේඩ් කයින්ඩ්ලි

“ඒක  ඉක්මනින් ආපහු දෙන්න කරදර වෙන්න ඕන නැහැ . ඔයා ආපහු එනකොට ඒක  ගේන්න  පුළුවන්.  ඕගොල්ලන්ට තව සති කීපයක් ස්කොල නිවාඩු තියෙනවනේ “ ඇය  කාරුණිකව කීවාය

…………..

එහි බොහෝ වාක්‍යයන්  තිබුණා එදිනෙදා කතාවේදී ප්‍රයෝජනවත් විය හැකි. ඒවා සියල්ල හොඳින් ග්‍රහණය කර ගන්න . ඉන් වඩාත් වැදගත් වාක්‍යය කිහිපයක් අපි පහතින් සදහන් කරනවා

Can’t you stay  a little longer ?
කාන්ට්  යු ස්ටේ අ ලිට්ල් ලෝංග(ර්) ?
ඔයාට තව ටිකක් වෙලා ඉන්න බැරිද ?

It won’t rain soon
ඉට්  වෝන්ට් රේන්  සූන්
ඉක්මනින් වහින එකක් නෑ

Let’s have some tea before you go
ලෙට්ස්  හැව්  සම් ටී බිෆෝ යූ ගෝ
යා යන්න කලින් තේ ටිකක් බොමු

I think I should go home before it rains. Otherwise, I will get wet
අයි තිංක් අයි ෂුඩ් ගෝ හෝම් බිෆෝ ඉට් රේන්ස්. අද(ර්)වයිස් අයි විල් ගෙට්  වෙට්
මං  හිතන්නේ මං  ගෙදර යන්න   ඕන වහින්න කලින්. නැත්නම් මං  තෙමෙයි

They had so much to talk about
දේ හැඩ් සෝ මච් ටු ටෝක් අබවුට්
ඔවුන්ට කතා කිරීමට බොහෝ දේ තිබුණි

In their village school, everyone was friendly with each other.
ඉන් දෙයා විලේජ් ස්කූල් එව්රි වන් වෝස් ෆ්‍රෙන්ඩ්ලි විත් ඊච් අද(ර්)
ඔවුන්ගේ ගමේ පාසලේ නම් සෑම කෙනෙකුම සෑම  කෙනෙක් සමගම මිත්‍රශීලි විය

I’m happy that I didn’t leave our village school
අයිම් හැපී දැට් අයි ඩිඩ්න්ට් ලීව් අව(ර්) විලේජ් ස්කූල්
මට සතුටුයි මම අපේ ගමේ ඉස්කෝලේ දාල නොගිය එකට

Everything feels familiar
එව්රිතිං ෆීල්ස් ෆමිලිය(ර්)
හැමදේම හුරුපුරුදු විදියට දැනෙන්නේ

“Are you friends with all the students in your class?” Supun asked curiously.
“ආ යූ ෆ්‍රෙන්ඩ්ස් විත් ඕල් ද ස්ටුඩන්ට්ස් ඉන් යුව(ර්) ක්ලාස් ? “ සුපුන් ආස්ක්ඩ් කියුරියස්ලි
“ඔයා පන්තියේ ඔක්කොම ළමයි එක්ක යාලුද ? “සුපුන් කුතුහලයෙන් ඇසුවේය

Everyone tries to be the best
එව්රිවන් ට්‍රයිස් ටු බී ද බෙස්ට්
හැමෝම උත්සාහ කරන්නේ හොඳම කෙනා වෙන්න

Boys, please have some sweetmeats. I made them especially for you
බෝයිස් , ප්ලීස් හැව් සම් ස්වීට් මීට්ස්. අයි මේඩ් දෙම් ස්පෙෂලි ෆෝ යූ
ළමයි , රසකැවිලි ටිකක් කන්න , මම විශේෂයෙන්ම ඒවා ඔගොල්ලන්ට හැදුවේ

Oh, so early?”
“ඕහ් , සෝ අ(ර්)ලි ?”
“ආ , මෙච්චර වේලාසනින් ?”

It seemed like it would rain soon.
ඉට් සීම්ඩ් ලයික් ඉට් වුඩ් රේන් සූන්
ඉක්මනින් වහින බව පෙනෙන්නට තිබුණි

The clouds are gathering
ද ක්ලවුඩ්ස් ආ ගැදරිං
වලාකුල් එකතු වෙනවා(ආකාසේ අඳුරු වෙනවා )

I think you should wait until the rain stops. Otherwise, you will get caught in the rain
අයි තිංක් යූ ෂුඩ් වේට් අන්ටිල් ද රේන් ස්ටොප්ස් . අද(ර්)වයිස් යූ විල් ගෙට් වෙට් ඉන් ද රේන්

“මම හිතන්නේ ඔයා ඉන්න ඕන වැස්ස පායනකල් . එහෙම නැත්නම් ඔයාව වැස්සට අහුවේවි

That’s what I just told him, Amma
දැට්ස් වට් අයි ජස්ට් ටෝල්ඩ් හිම්
ඒක තමයි මම දැන් ඔහුට කිව්වේ

If I stay until the rain stops, it will be dark
ඉෆ් අයි(ඉෆයි ) ස්ටේ අන්ටිල් ද රේන් ස්ටොප්ස් ඉට් විල් බී ඩාක්
මම වැස්ස පායනකල් හිටියොත් , කළුවර වේවි

Don’t worry about returning it soon
ඩෝන්ට් වොරි අබවුට් රිට(ර්)නිං ඉට් සූන්
ඒක ඉක්මනින් ආපහු දෙන්න කරදර වෙන්න ඕන නැහැ

**Vocabulary 69**

friendship - ෆ්‍රෙන්ඩ්ෂිප් - මිත්‍රත්වය

longer - ලෝංග(ර්) - වඩා වැඩි කාලයක්

sweetmeats - ස්වීට් මීට්ස් - රස කැවිලි

get wet - ගෙට් වෙට් - තෙමෙනවා

scold - ස්කෝල්ඩ් - බනිනවා

scholarship - ස්කොල(ර්)ෂිප් - ශිෂ්‍යත්වය

well known - වෙල් නෝ(ව්)න් - හොඳින් දන්නා , ප්‍රසිද්ධ

siblings - සිබ්ලිංග්ස් - සහෝදර සහෝදරියෝ

focus - ෆෝකස් - අවධානය යොමු කරනවා

focused - ෆෝකස්ඩ් - අවධානය යොමු වූ , අවධානය යොමු කර සිටින

rules - රූල්ස් - නියමයන්

popular - පොපියුල(ර්) - ජනප්‍රිය

in total - ඉන් ටෝටල් - මුළු ගණනින්

the rest - ද රෙස්ට් - ඉතිරිය

strange - ස්ට්‍රේන්ජ් - පුදුම , අමුතු

each other - ඊච්  අදර් - එකිනෙකා

plateful - ප්ලේට්ෆුල් - පිගානක් පිරෙන ප්‍රමාණය

fall sick - ෆෝල් සික් - ලෙඩ වෙනවා

before then - බිෆෝ දෙන්  - ඊට පෙර

vacation - වැකේෂන් - නිවාඩුව